# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 ජූලි මස 09 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. **ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2013.06.18 වන දින අසන ලද ප්‍රශ්නය :** (ප්‍ර/v/(1)13/09)

අ. කළුතර සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී කාර්යාලයෙන් පාලනය වන මෝල්කාව මධ්‍යම බෙහෙත් ශාලාව ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි මහජනතාවට අත්‍යාවශ්‍ය බෙහෙත් ශාලාවක් බව ඔබතුමා දන්නෙහි ද ?

ආ. එම මධ්‍යම බෙහෙත් ශාලාවෙහි වහලය, දොරවල් දිරාපත් වී කැසිකිලි පද්ධතිය අක්‍රිය වී, පානීය ජලය සඳහා ඇති ළිඳ අපවිත්‍ර වී, සිවිලිම කඩා වැටෙමින් පවතින බව ඔබතුමා දන්නෙහිද ?

ඇ. විශාල පිරිසක් සතියකට දෙවරක් ප්‍රතිකාර ලබා ගන්නා මෙම මධ්‍යම බෙහෙත් ශාලාව ප්‍රතිසංස්කරණය කර පාවිච්චියට සුදුසු තත්වයට පත් කල යුතු බව ඔබතුමා පිළිගන්නේද ?

ඈ. එසේ පිළිගන්නේ නම් ඔබතුමා මෙතෙක් ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද ?

ඉ. එසේ ක්‍රියාමාර්ග ගෙන නොමැති නම් ඒ කුමක් නිසාද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

1) ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :

"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුල මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි. අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."
(යෝ/v(01)13/02)

2) ගරු කීර්ති උඩවත්ත මන්ත්‍රීතුමා :

"වර්තමානයේ වාර්තා වන පරිදි ප්‍රාදේශිය දේශපාලනයේ සිට ජාතික දේශපාලන තලය දක්වා වූ මහජන නියෝජිතයන්ගේ ගුණාත්මකභාවය අතිශයින්ම පිරිහෙමින් පවතී. ඊට පිළියමක් වශයෙන් මැතිවරණ වලදී නාම යෝජනා ලබා දීමේදී දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාම ලේඛණ විද්වත් මණ්ඩලයකට යොමු කොට එයින් නිර්දේශ වන නම් පමණක් පිළිගැනීමට මැතිවරණ කොමසාරිස් වෙත නියම කෙරෙන පරිදි නව නීති රීති සැකසිය යුතු බවට මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."
(යෝ/v(01)13/03)

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.06.19 දින,
සභා ලේකම් කාර්යාලය ,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.